# ලංසු සඳහා ආරාධනයයි

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත බේස් ප්ලේට් 90 (A) LBS. (BASE PLATES 90 (A) LBS.) සහ ඇණ හා මුරුච්චි (BOLTS & NUTS) සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය - SRS/F. 8185

01. ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දුම්රිය ප්‍රධාන කාර්යාලය, තැ.පෙ. 355, කොළඹ, ශ්‍රී ලංකාව යන ලිපිනයේ පිහිටි දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා බේස් ප්ලේට් 90 (A) Lbs. සහ ඇණ හා මුරුච්චි සැපයීම වෙනුවෙන් සුදුසුකම් ලත් යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු මෙමගින් කැඳවනු ලැබේ. ලංසුකරුවන් තමන් විසින් ඇටෝර්නි බලපත්‍රයක් (Power of Attorney) මගින් බලය පවරන ලද පිළිගත් නියෝජිතයෙකු හරහා සිය ලංසු ඉදිරිපත් කළ හැකිය.

02. ලංසුකරණ ක්‍රියාවලිය ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය (International Competitive Bidding) හරහා සිදු කරනු ලැබේ.

03. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්හට වැඩිදුර තොරතුරු ලබා ගතහැකි අතර, 2026.06.12 දින සිට 2026.07.27 දක්වා සතියේ දිනවල පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා කාලය තුළ පහත සඳහන් ලිපිනයේදී ලංසු ලේඛන පරීක්ෂා කළ හැකිය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),**
**ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඔල්කට් මාවත, කොළඹ 10,**
**ශ්‍රී ලංකාව.**

| | | |
|---|---|---|
| **දුරකථන අංක** | : | **94 (11) 2438078 හෝ 94 (11) 4600204** |
| **ෆැක්ස් අංකය** | : | **94 (11) 2432044** |
| **විද්‍යුත් තැපැල** | : | **(Email) : srs.slr@gmail.com** |
| **වෙබ් අඩවිය** | : | **www.railway.gov.lk** |

04. නිෂ්පාදන ක්ෂේත්‍රයේ වසර 10 ක පළපුරුද්දක් සහ සමාන අයිතම සඳහා අපනයන වෙළඳපොළෙහි අවම වශයෙන් වසර 5 ක පළපුරුද්දක් ඇති, එමෙන්ම සමාන ස්වබාවයේ නිෂ්පාදන කටයුතු සඳහා වලංගු ISO 9001 : 2008 සහතිකය හිමි ලංසුකරුවන් ලංසු ඉදිරිපත් කිරීම සඳහා සුදුසුකම් ලබයි.

05. උනන්දුවක් දක්වන ලංසුකරුවන් විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) දුම්රිය ප්‍රසම්පාදන අනුදෙපාර්තමේන්තුව, ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව යන ලිපිනයට හෝ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙත ලිඛිත ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් පසුව, ඉංග්‍රීසි භාෂාවෙන් වන සම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් මිලදී ගත හැකිය. මෙය 2026.06.12 සිට 2026.07.27 දින පස්වරු 3.00 දක්වා (ශ්‍රී ලංකා වේලාවෙන්) රුපියල් 9,125/- ක ආපසු නොගෙවන ප්‍රසම්පාදන ගාස්තුවක් හෝ නිදහසේ පරිවර්තනය කළ හැකි විදේශ මුදලකින් ඊට සමාන මුදලක් ගෙවීමෙන් ලබාගත හැක.

06. ලංසු 2026.07.28 දින පස්වරු 2.00 ට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට භාර දිය යුතුය.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඔල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**

ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු 2026.07.28 දින පස්වරු 2.00 ට, කාමර අංක 01, 3 වැනි මහල, ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1347, ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව යන ස්ථානයේදී සහභාගි වීමට කැමති ලංසු කරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදීම විවාත කරනු ලැබේ.

**යොමු අංකය : SRS/F. 8185**

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**